# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2038/69 - 2017 සැප්තැම්බර් මස 29 වැනි සිකුරාදා - 2017.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

2016 වර්ෂයේ අංක 01 දරන උතුරු පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ප්‍රඥප්තිය

2016 වර්ෂයේ අගෝස්තු මස 09 වැනි දිනැති අංක 1979/26 සහිත *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද 2016 වර්ෂයේ අංක 01 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ නිවේදනය අවලංගු කරනු ලබන බව මෙමගින් දැනුවත් කරනු ලැබේ.

සී. වී. කේ. සිවඥානම්,
සභාපති,
උතුරු පළාත් සභාව.

2017 සැප්තැම්බර් මස 27 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
ඒ 9 මාර්ගය,
කයිතඩි.

10- 435/1

---

**උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රඥප්තිය අංක 01/2016**

උතුරු පළාත් පළාත් සභාව විසින් 2016 වසරේ ජුනි මස 14 වැනි දින අනුමත කරන ලද 2016 වසරේ අංක 01 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රඥප්තියට උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් 2016 වසරේ ජූලි මස 29 වැනි දින අනුමැතිය ලබා දී ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. තෙයිවේන්ද්‍රම්,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

2017 සැප්තැම්බර් මස 27 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
ඒ 9 පාර,
කයිතඩි.


1A - PG 3707 — 08 (2017/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උතුරු පළාතේ පළාත් සභාව

### මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රඥප්තිය

**උතුරු පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියක් පිහිටුවීම සඳහා ද, මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :

ලුහුඬුනාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මෙම ප්‍රඥප්තිය 2016 අංක 01 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙම ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලබාදෙනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රඥප්තියේ අරමුණු.

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි විය යුතු ය-

(අ) උතුරු පළාතේ පදිංචි තැනැත්තන් සඳහා සුරක්ෂිත සහ ආරක්ෂාකාරී ප්‍රවාහන සේවාවක් ලබාදීම ;

(ආ) මගීන් සඳහා පහසු ගුණාත්මක තත්ත්වයෙන් යුත් මාර්ගස්ථ ප්‍රවාහන සේවාවන් තහවුරු කිරීම ;

(ඇ) සැපපහසු හා ප්‍රසන්න ගමන් කිරීමේ පරිසරයක් ලබාදීම ;

(ඈ) උතුරු පළාතේ සියලුම ප්‍රදේශ සඳහා ප්‍රවාහන සේවාවන් ව්‍යාප්ත කිරීම ;

(ඉ) මගී ප්‍රවාහන සේවය සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ;

(ඊ) ගමන් කිරීමේ දුබලතා සහිත තැනැත්තන්ට ප්‍රවාහනය සඳහා පූර්ණ ප්‍රවේශයක් ලබාදීම;

(උ) ජාතික ප්‍රවාහන මණ්ඩලය සහ පුද්ගලික අංශය අතර සාධාරණ තරගකාරීත්වයක් ඇති කිරීම තුළින් කාර්යක්ෂම මගී සේවාවක් ලබාදීම.

## *I* වන කොටස

### *මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිහිටුවීම*

මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිහිටුවීම.

3. (1) මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය, මෙම වගන්තියෙන් එයට දෙන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි විය යුතු ය.

අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය.

4. (1) අධිකාරියේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත පැවරිය යුතු අතර එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම් -

(i) ප්‍රවාහන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට වඩා අඩු නොවන යම් ධුරයක් දරනු ලබන නිලධරයකු ;

(ii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයකු ;

(iii) මුදල් විෂයය පවරනු ලැබ ඇති පළාත් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධරයකු ;

(iv) උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස් ;

(v) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා ; සහ

(ආ) (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රවාහන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන් -

(i) පුද්ගලික බස්රථ ආයෝජන සමාගම්වල සංගමයේ සභාපතිවරයා හෝ එම සංගමය විසින් නම් කරනු ලබන එම සංගමයේ පරිපාලන මණ්ඩලයේ යම් සාමාජිකයකු ;

(ii) නීතිය, ප්‍රවාහනය, වාණිජ්‍ය, ඉංජිනේරු විද්‍යාව, අධ්‍යාපනය, මුදල් හෝ පරිපාලනය යන ක්ෂේත්‍රවල ප්‍රසිද්ධියක් උසුලන සහ පිළිගත් සුදුසුකම් ඇති සාමාජිකයන් පස්දෙනකු ;

(iii) රථවාහන ගමනාගමනය සහ රථවාහන පාලනය විධිමත් කිරීම සඳහා සේවය ලබාදී ඇති යම් සාමාජිකයකු ;

(iv) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් නිර්දේශ කරන ලද කළමනාකාරවරයාගේ ධුරයට වඩා අඩු නොවන යම් ධුරයක් දරනු ලබන යම් සාමාජිකයකු ; සහ

(v) ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලයේ සභාපතිවරයා විසින් නිර්දේශ කරන ලද කළමනාකාරවරයාගේ ධුරයට වඩා අඩු නොවන යම් ධුරයක් දරනු ලබන සාමාජිකයකු ;

(2) මණ්ඩලයේ සභාපතිවරයා, අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් පත්කළ යුතු ය.

(3) සෑම පත්කළ සාමාජිකයකු ම, මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස්කරතහොත් මිස ඔහු පත් කරන ලද දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් එසේ කිරීම සුදුසු යයි සලකනු ලබන විට දී, හේතු දක්වා යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(5) යම් පත්කළ සාමාජිකයකුට ඕනෑම අවස්ථාවදී ලියාපදිංචි තැපෑලෙන් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) යම් පත්කළ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලබන යම් සාමාජිකයකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(7) යම් පත්කළ සාමාජිකයකු අසනීප වීම, අබලතාවයකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා මාස තුනකට නොඅඩු කාලයක් තාවකාලිකව තම ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා වෙත ලිඛිතව එම නොහැකියාව පිළිබඳව දැනුම් දීම එම සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. අමාත්‍යවරයා විසින් එම තොරතුරු තමා වෙත ලැබුණු විට (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ රැස්වීම් හා සණපූරණය.

5. (1) මණ්ඩලයේ රැස්වීම් සඳහා සණපූරණය සාමාජිකයන් හයදෙනෙකු විය යුතු ය.

(2) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් අතුරින් තිල බලයෙන් පත්කළ සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කළ යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමකදී තීරණයක් ගැනීම සඳහා වූ සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව එක සමාන වන අවස්ථාවක දි සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් හිමිවිය යුතු ය.

(4) මෙම වගන්තියේ පූර්වයෙන් වූ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්යපටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

පුරප්පාඩුවක් හේතුවෙන් මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු බලරහිත නොවිය යුතු බව.

6. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත්කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

7. මණ්ඩලයේ සාමාජිකයන්ට පළාත් සභාවේ අනුමැතිය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයෙන් හා එවැනි අනුප්‍රමාණ අනුව යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකු බවට පත්වීම සඳහා වන නුසුදුසුකම්.

8. 4 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තකු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත්කරනු ලැබීම සඳහා හෝ සාමාජිකයකු වශයෙන් දිගටම කටයුතු කරගෙන යාමට පහත හේතු මත සුදුස්සකු නොවිය යුතු ය.

(අ) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු නම් හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු නම් හෝ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත්වන්නේ නම් ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක පවතින යම් නීතියක් යටතේ බුන්වත් තැනැත්තකු හෝ නොබිඳුණු බංකොලොත්කරුවකු ලෙස ප්‍රකාශයට පත් කරන ලද තැනැත්තකු වීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු වශයෙන් තීරණය කරන ලද හෝ ප්‍රකාශ කරන ලද තැනැත්තකු වීම ;

(ඈ) මාස හයකට නොඅඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැකි චරිත දූෂණය පිළිබඳ වරදක් සම්බන්ධයෙන් වරදකරු වී ඇති තැනැත්තකු වීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටින ලද හෝ යටත්ව සිටින තැනැත්තකු වීම ;

(ඊ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අගතිදයක ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇති තැනැත්තකු වීම ; හෝ

(ඌ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටුකිරීමේ දී අන් අය පීඩාවට පත්වන අයුරින් නුසුදුසු ආකාරයෙන් ක්‍රියා කරනු ලබන තැනැත්තකු වීම.

අධිකාරියේ මුද්‍රාව.

9. (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කළ තීරණය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(2) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ අනුමතය ඇතිව මිස සහ තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි හෝ ලේඛනයේ අත්සන් තැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ දී හැර අධිකාරියේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ වාර්තාවක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

## *II වන කොටස*

*අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය*

10. අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය පහත සඳහන් පරිදි විය යුතු ය -

අධිකාරියේ බලතල, කාර්තව්‍ය සහ කාර්ය.

(අ) උතුරු පළාත තුළ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා පිළිගත් ගුණාත්මක තත්ත්වයෙන් යුත් බස් රථ සේවාවන් පැවතීම අධීක්ෂණය කිරීම සහ කාලසටහන් සකස් කිරීම හා බස්රථ ක්‍රියාකරුවන් විසින් එම කාල සටහන්වලට අනුකූලව ක්‍රියා කරනු ලැබීම තහවුරු කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම ;

(ආ) කාර්යක්ෂම සහ සුරක්ෂිත ප්‍රවාහනය සඳහා බස්රථ ක්‍රියාකරුවන් වෙත පොදු සහ විශේෂ විධාන නිකුත් කිරීම ;

(ඇ) මගීන් ප්‍රවාහනය සඳහා බස්රථ යොදා ගැනීම පිණිස බලය පවරනු ලබන මගී සේවා බලපත්‍ර නිකුත් කිරීම හෝ අලුත් කිරීම ;

(ඈ) මගී සේවා බලපත්‍ර නිකුත් කිරීම සඳහා සහ බස්රථ ක්‍රියාකරුවන් ලියාපදිංචි කිරීම සඳහා කොන්දේසි නියම කිරීම ;

(ඉ) මගී සේවා බලපත්‍ර නිකුත් කරනු ලබනුයේ යම් කොන්දේසිවලට යටත්ව ද එකී කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීම තහවුරු කිරීම ;

(ඊ) බස්රථ සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා යම් ආයතනයන් වෙත නිර්දේශ ලබා දීම ;

(උ) අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි යම් වාර්තා හා තොරතුරු ලබාදෙන ලෙස මගී සේවා බලපත්‍ර දරන්නන්ට නියම කිරීම ;

(ඌ) මගී සේවා බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම සහ සංශෝධනය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ වෙනත් යම් කාරණයක් සඳහා අයකරනු ලැබිය යුතු ගාස්තු කලින් කළ නිශ්චය කිරීම සහ සංශෝධනය කිරීම ;

(එ) මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන මගී ප්‍රවාහන සේවා බලපත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහන සඳහා යොද ගනු ලබන යම් බස්රථයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ගමනාන්ත පුවරු, අංක තහඩු සහ සංකේත සම්බන්ධයෙන් වන කාරණා නියම කිරීම ;

(ඒ) බස්රථවල රියදුරන් සහ කොන්දෙස්තරවරුන් එහි පවත්වාගෙන යායුතු ලේඛන සහ ඒවායේ වාර්තා කළ යුතු තොරතුරු නිශ්චිතව දැක්වීම ;

(ඔ) යම් බලපත්‍ර දරන්නකු විසින් මගී ප්‍රවාහනය සඳහා යොද ගනු ලබන යම් බස් රථයක පවත්වාගෙන යා යුතු ගුණාත්මක තත්ත්වය පිළිබඳ ප්‍රමිති හා යෝග්‍යතාව පිළිබඳ තත්ත්වය සම්බන්ධයෙන් වන කාරණා නියම කිරීම ;

(ඕ) මගී ප්‍රවාහනය සඳහා යොදු ගනු ලබන බස්රථවල සේවා වාර ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පවත්වාගෙන යා යුතු වාර්තා නිශ්චය කිරීම ;

(ක) මගී ප්‍රවාහනය සඳහා යොදා ගනු ලබන යම් බස්රථයක රියදුරු සහ කොන්දෙස්තරවරයා වශයෙන් සේවය කරනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා සහ ඔවුන්ගේ සේවාවන් ආරම්භ කිරීම සහ අවසන් කිරීම, අවසර දෙනු ලබන විවේක කාලයන් සහ බලපත්‍ර දරන්නකු විසින් එවැනි යම් තැනැත්තන්ට ගෙවිය යුතු වැටුප්, දීමනා හෝ ගාස්තු නිශ්චය කිරීම ;

(ග) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිටින යම් තැනැත්තකු සමග සෘජුව හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු ගිවිසුම් හෝ එකඟතාවන්ට එළඹීම, ඉටුකිරීම හා ක්‍රියාත්මක කිරීම ;

(ච) මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් වන නීති විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා පියවර ගැනීම, එවැනි නීති විරෝධී ක්‍රියා වැළැක්වීමේ කාර්යය සඳහා බලකායන් පිහිටුවීම සහ එවැනි බලකායන්වල බලතල සහ කර්තව්‍ය නියම කිරීම ;

(ජ) අධිකාරිය විසින් ලබාදනු ලබන යම් සේවාවන් සඳහා ගාස්තු අය කිරීම ;

(ට) ප්‍රවාහන සේවාවල යෙදී සිටින සමාගම් හෝ සංවිධාන සමග එක්ව පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම ;

(ඩ) ප්‍රවාහන සේවාවල යෙදී සිටින තැනැත්තන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ඒවාට සහභාගි වන තැනැත්තන් වෙත සහතික නිකුත් කිරීම ;

(ණ) අධිකාරියේ සේවයේ යෙදී සිටින තැනැත්තන් පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ත) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට ලබා ගැනීම හෝ දීම හෝ කුළියට ලබා ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම ;

(ද) ත්‍යාග, ප්‍රදන, පරිත්‍යාග හෝ සහනාධාර, මුදල් වශයෙන් හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා ඒවා යොද ගැනීම ;

එසේ වුව ද, මණ්ඩලය විසින්, අධිකාරිය වෙත ලබාදෙනු ලබන සියලුම විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය ; සහ

(න) ප්‍රඥප්තියේ අරමුණු නිසි ලෙස සහ ඵලදයී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ සුදුසු සියලු වෙනත් යම් ක්‍රියා සිදු කිරීම ;

## *III* වන කොටස

*මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම*

11. (මෙහි මින්මතු "බලපත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරිය මගින් ප්‍රදානය කරනු ලබන මගී ප්‍රවාහන සේවා බලපත්‍රයක අධිකාරිය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් යම් ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් ප්‍රවාහනය පිණිස උතුරු පළාත තුළ ආරම්භ වන දෛනික සේවාවක හෝ විශේෂ සේවාවක කාර්යය සඳහා යම් බස්රථයක් යොද නොගත යුතු ය. දෛනික සේවා සහ විශේෂ සේවා සඳහා මගී ප්‍රවාහන සේවා බලපත්‍ර.

12. 11 වන වගන්තිය යටතේ වන සෑම ඉල්ලුම්කරුවෙකුම එම බස්රථයේ ලියාපදිංචි හිමිකරු විය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතු ය. ඉල්ලුම්කරුවකු සපුරාලිය යුතු අවශ්‍යතා

(අ) එම බස්රථය සඳහා වලංගු ආදයම් බලපත්‍රයක් ; සහ

(ආ) එම බස්රථය සම්බන්ධයෙන් ඔහුගේ නමින් තෙවන පාර්ශවයේ අවදනම්වලට එරෙහිව වලංගු සීමාරහිත රක්ෂණයක් පැවතිය යුතු ය.

13. (1) බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලම්පත්‍රයක්ම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් බස්රථයක් සම්බන්ධයෙන් ද එම බස්රථයේ ලියාපදිංචි හිමිකරු විසින් ඔහුගේ අත්සනින් යුතුව, නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, නියමිත ගාස්තුව ඒ සමග ඉදිරිපත් කළ යුතු ය. අධිකාරිය විසින් අවශ්‍ය අවස්ථාවන්හි දී යම් ඉල්ලුම්කරුවකු වෙත අපරාධ වාර්තා ඇතුලු වැඩිදුරටත් වූ තොරතුරු ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය. බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රය.

(2) සෑම ඉල්ලුම්කරුවකු විසින්ම බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රය සමග පහත සඳහන් විස්තර ඉදිරිපත් කළ යුතු ය.

(අ) ඉල්ලුම් පත්‍රයට අදළ බස්රථයේ ලියාපදිංචි අංකය, ආසන සංඛ්‍යාව, නිෂ්පාදිත දිනය සහ බස්රථයේ ඇතුළත උස ;

(ආ) අනුමත ආයතනයක් විසින් නිකුත් කරන ලද ඉල්ලුම්පත්‍රයට අදළ බස්රථයේ යෝග්‍යතා සහතිකයේ පිටපතක් ;

(ඇ) ආරම්භ වන ස්ථානය, වැදගත් අතරමැදි නැවතුම් ස්ථානය, ගමනාන්තය, මාර්ග අංකය සහ මාර්ගයේ දුර ; සහ

(ඈ) අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයකම සියලු නියම කරනු ලබන විස්තර පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි තොරතුරු ඇතුළත් විය යුතු ය.

(4) යම් ඉල්ලුම්පත්‍රයක සාවද්‍ය, නොමඟ යවන සුළු හෝ වැරදි සහගත තොරතුරු හෝ විස්තර ඇතුළත් බවට තීරණය කරනු ලැබූ විට, එම ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ යුතු ය.

14. (1) අධිකාරිය විසින්, කලින් කල ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබිය හැකි ය. මෙම අවස්ථාව අවම වශයෙන් දේශීය මාධ්‍ය තුනක පළ කරනු ලබන යම් දැන්වීමක් මගින් හෝ ඒ සඳහා වැඩිම ප්‍රසිද්ධියක් ලැබෙනු ඇතැයි සලකනු ලබන වෙනත් යම් ආකාරයකින් සඳහන් කළ යුතු ය. ප්‍රවාහන සේවා සඳහා ටෙන්ඩර් කැඳවීම.

(2) අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ පළ කරනු ලබන දැන්වීමෙහි 13 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ නිශ්චිතව සඳහන් යම් නියමයන් සපුරාලනු ලබන සමාගම් වෙත ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම සඳහා වන ඔවුන්ගේ අරමුණ සඳහන් කරමින් ටෙන්ඩර් ඉදිරිපත් කරන ලෙස ඇරයුම් කළ යුතු ය.

(3) ඉල්ලුම්කරු විසින් (1) වැනි උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන නිශ්චිත මාර්ගය හෝ මාර්ග සම්බන්ධයෙන් සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

(4) අධිකාරිය විසින් අවසන් දිනය වන විට ඒ වෙත ලැබී ඇති සියලු ටෙන්ඩර් විවෘත කළ යුතු අතර ඉල්ලුම්කරුගේ අවශ්‍යතා. පළපුරුද්ද සහ මූල්‍ය සහ තාක්ෂණික හැකියාවන් ඇගයීමට ලක් කළ යුතු ය.

(5) මෙම වගන්තිය යටතේ ටෙන්ඩරයක් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් 15, 16, 17, 18, 19, 20, 21, 22, 23, 24 හා 25 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

යෝග්‍යතා සහතිකය.

15. (1) අදාළ පරීක්ෂා සහ සෝදිසි කිරීම් සිදු කිරීමෙන් පසුව යම් බස්රථ සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා යම් නිශ්චිත ආයතන වෙත අධිකාරිය විසින් නිර්දේශ ඉදිරිපත් කළ හැකි ය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ නිර්දේශ ලැබීමෙන් පසු අමාත්‍යවරයා විසින් යෝග්‍යතා සහතික නිකුත් කිරීමේ කාර්යය සඳහා අනුමත ආයතන වශයෙන් යම් ආයතන වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) මෙම වගන්තිය යටතේ දැනුම් දෙනු ලබන සෑම ආයතනයක් ම අධිකාරියේ ලියාපදිංචි විය යුතු ය.

බලපත්‍රය නිකුත් කිරීම සඳහා වන නිර්ණායක.

16. අධිකාරිය විසින් බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු ය -

(අ) යෝජිත මගී ප්‍රවාහනය මහජනතාව සම්බන්ධයෙන් කොතෙක් දුරට අවශ්‍ය වන්නේ ද හෝ අපේක්ෂා කරනු ලබන්නේ ද යන්න ;

(ආ) යෝජිත මාර්ගය හෝ මාර්ගවල යෝග්‍යතාවය ;

(ඇ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල අවශ්‍යතා දැනටමත් ප්‍රමාණවත් පරිදි ඉටු කරනු ලැබ ඇත්තේ කොතෙක් දුරට ද යන්න ;

(ඈ) ප්‍රමාණවත්, සුදුසු හා කාර්යක්ෂම ප්‍රවාහන සේවා ලබා දීම ඇතුළු සමස්ථයක් වශයෙන් රථවාහන ගමනාගමනය සම්බන්ධයෙන් අදාළ ප්‍රදේශයේ අවශ්‍යතා සහ දුම්රිය ප්‍රවාහනය ඇතුළු සියලු ආකාර මගී ප්‍රවාහන සේවාවන් සම්බන්ධීකරණය කිරීම ;

(ඉ) යම් ප්‍රදේශයක් තුළ හෝ යම් මාර්ගයක මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා දුම්රිය ගමනාගමනය මගින් ලබාදෙනු ලබන පහසුකම් ඇතුළු යම් ප්‍රවාහන පහසුකම් අධිකාරියේ මතය අනුව සෑහීමකට පත්විය හැකි තත්ත්වයෙන් පවතින බවට හා කාර්යක්ෂම වන බවට සහ එම හේතුවෙන් එම ප්‍රදේශය ඇතුළත හෝ ප්‍රධාන වශයෙන් එම මාර්ගය හරහා එකී ප්‍රවාහන පහසුකම් සමග තරගයක් ඇතිවන අයුරින් මගී ප්‍රවාහනය සඳහා බලය පවරනු ලබමින් බලපත්‍රයක් ප්‍රදානය කිරීම සුදුසු නොවන බවට යම් අවස්ථාවල දී සලකනු ලැබීම ;

(ඊ) යම් මාර්ගයක් හෝ මාර්ග සඳහා බලපත්‍ර එකක් හෝ කිහිපයක් දැනටමත් දරනු ලබන යම් ඉල්ලුම්කරුවකුට එම මාර්ගය හෝ මාර්ග සඳහා තවත් බලපත්‍රයක් ප්‍රදානය කිරීමෙන් අපේක්ෂා කරනු නොලබන යම් ප්‍රතිඵල ඇතිවිය හැකි බවට අධිකාරිය වෙත සාධාරණ විශ්වාසයක් ඇතිවිය හැකි යම් අවස්ථාගත කරුණු.

බලපත්‍ර නිකුත් කිරීම සඳහා මනාපය ලබාදීම.

17. 16 වැනි වගන්තිය යටතේ වන නිර්ණායක සෑහීමට පත්කිරීමෙන් පසුව, අධිකාරිය විසින් අදාළ ප්‍රදේශයේ හෝ දිස්ත්‍රික්කයේ පදිංචි ඉල්ලුම්කරුවකු වෙත තම මනාපය පළ කළ හැකි ය.

පරීක්ෂා කිරීම.

18. 13 වැනි වගන්තිය යටතේ යම් ඉල්ලීමක් ලැබුණු විට, අධිකාරිය විසින් ඉල්ලුම් පත්‍රය අදාළ වන්නා වූ බස්රථය පරීක්ෂා කරනු ලැබීම සඳහා අධිකාරියේ යම් නිලධරයකු වෙත බලය පවරනු ලැබිය යුතු ය.

19. 18 වැනි වගන්තිය යටතේ බලය පවරන ලද නිලධරයා ඔහුගේ පරීක්ෂා කිරීම අවසන් කිරීමෙන් පසුව බස්රථය සම්බන්ධයෙන් ඔහු විසින් සිදු කරන ලද පරීක්ෂාව පිළිබඳ සියලු අදාළ තොරතුරු සඳහන් කරමින් අධිකාරිය වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. එම වාර්තාවෙහි අදාළ බස්රථය ප්‍රවාහන සේවා ලබාදීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය සහ නිසි තත්ත්වයෙන් පවතින්නේ ද යන්න ඇතුළත් විය යුතු ය. වාර්තාව.

20. 19 වැනි වගන්තිය යටතේ වන වාර්තාව ලැබුණු විට, අධිකාරිය විසින් වාර්තාවෙහි ඇතුළත් කරුණු සහ යම් නිර්දේශ ඇත්නම් ඒවා සැලකිල්ලට ගැනීමෙන් පසුව බලපත්‍රය නිකුත් කිරීම හෝ වාර්තා කරනු ලබන හේතු මත බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය. බලපත්‍ර නිකුත් කිරීම.

21. 20 වැනි වගන්තිය යටතේ වන බලපත්‍රයක් - බලපත්‍රයේ ආකෘතිය සහ කාලසීමාව.

(අ) අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියකින් විය යුතු ය ;

(ආ) බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය ;

(ඇ) බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් දිනයක සිට බලාත්මකභාවයට පත්විය යුතු ය ; සහ

(ඈ) කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාව සඳහා වලංගුව පැවතිය යුතු ය.

22. (1) 20 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අළුත් කරවා ගැනීම සඳහා එම බලපත්‍රයේ කල් ඉකුත් වන දිනට දින තිහකට නොඅඩු කාලයකට පෙර නියමිත ආකෘතිය අනුව වූ ඉල්ලීමක් නියමිත අළුත් කිරීමේ ගාස්තුව සමග අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය. බලපත්‍රය අළුත් කරවා ගැනීම.

(2) (1) වැනි උපවගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් ලැබුණු විට අධිකාරිය විසින් -

(අ) බලපත්‍ර දරන්නා නිකුත් කරන ලද බලපත්‍රයේ නියම හා කොන්දේසි උල්ලංඝණය කර නොමැති හෝ උල්ලංඝණය වන අයුරින් යම් ක්‍රියාවක් සිදුකර නොමැති විට ;

(ආ) බලපත්‍ර දරන්නා මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගයක් හෝ විධාන උල්ලංඝණය කර නොමැති විට ;

(ඇ) බලපත්‍ර දරන්නා ප්‍රවාහනය සම්බන්ධයෙන් අදාළ යම් ලිඛිත නීතියක යම් විධිවිධාන උල්ලංඝණය කර නොමැති විට,

යම් බලපත්‍රයක් අළුත් කරනු ලැබිය හැකි ය.

23. (1) 20 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අධිකාරිය විසින් පහත හේතු මත අත්හිටුවීම හෝ අවලංගු කරනු ලැබිය හැකි ය. බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම.

(අ) බලපත්‍රය ලබාගෙන ඇත්තේ සාවද්‍ය, නොමඟ යවන සුළු හෝ වැරදි සහගත තොරතුරු ලබාදීමෙන් බවට තීරණය කරනු ලැබූ විට ;

(ආ) රියදුරු හෝ කොන්දොස්තරවරයා විසින් මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගයක හෝ විධානයක යම් විධිවිධාන උල්ලංඝණය කර ඇති විට ;

(ඇ) මහජනතාවගේ උපරිම යහපත සඳහා එය අවශ්‍ය වන්නා වූ විට ;

(ඈ) මගීන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් බස්රථය අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති විට ;

(ඉ) ලියාපදිංචි හිමිකරු හෝ රියදුරු හෝ කොන්දොස්තරවරයා හිතාමතාම විධානයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇති විට.

(2) නිකුත් කරන ලද යම් බලපත්‍රයක් මෙම වගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි, අත්හිටුවීම හෝ අවලංගු කරන ලද විට, එම අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව බලපත්‍ර දරන්නා වෙත ඔහු විසින් ලබාදෙන ලද ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින් වහාම දැනුම්දීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

හේතු දැනුම් දිය යුතු බව.

24. 13 වැනි වගන්තිය හෝ 22 වැනි වගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි, යම් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කරවා ගැනීම සඳහා වන යම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන ලද විට අධිකාරිය විසින් එම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු වාර්තා කළ යුතු ය. එම ඉල්ලීම ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙත එම ඉල්ලීමේ සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතු දැනුම්දීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

අභියාචනා.

25. (1) අවස්ථාවෝචිත පරිදි, යම් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් හෝ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් තැනැත්තකුට අවස්ථාවෝචිත පරිදි, එම ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව තමා වෙත ලිඛිතව දැනුම් දෙන ලද දිනයේ සිට දින තිහක් ඇතුළත එම තීරණයට එරෙහිව අමාත්‍යවරයා වෙත අභියාචනය කළ හැකි ය.

(2) 1 වැනි උපවගන්තිය යටතේ වන අභියාචනයක් අමාත්‍යවරයා වෙත ලැබුණු විට අමාත්‍යවරයා විසින් ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරියන් දෙදෙනකු හා අමාත්‍යවරයා විසින් නම් කරන ලද නීතිඥයකු වන යම් තැනැත්තකුගෙන් සමන්විත කමිටුවක් සංස්ථාපනය කළ යුතු අතර එම අභියාචනය කමිටුව වෙත යොමු කළ යුතු ය.

(3) කමිටුව විසින් සුදුසු යයි සලකනු ලබන විට දී, (2) වැනි උපවගන්තිය යටතේ ඒ වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳව තීරණයකට එළඹීමට පෙර යම් පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ය.

(4) (2) වැනි උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳ තීරණය එම අභියාචනය ලැබුණු දින සිට දින හැටක් ඇතුළත ලබාදිය යුතු අතර එම අභියාචනය ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙත ඒ පිළිබඳ තීරණය වහාම දැනුම් දිය යුතු අතර අමාත්‍යවරයා වෙත එම තීරණය වාර්තා කළ යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් (4) වැනි උපවගන්තිය යටතේ වාර්තාවක් ලැබුනු විට එම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(6) මෙම වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳ කමිටුවේ තීරණය අවසානාත්මක විය යුතු ය.

බලපත්‍රය පැවරිය හැකි බව.

26. (1) යම් බලපත්‍රයක් දරන්නකු එම බලපත්‍රය මාරු කිරීමට නොහැක. නමුත් මාර්ගය හෝ වෙනත් තැනැත්තකුට පැවරීමට අදහස් කරනු ලබන විට අධිකාරිය වෙත ඉල්ලුම් කළ යුතු ය.

(2) අධිකාරිය විසින්, ඒ පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසුව එම පැවරීම සඳහා කොන්දේසි සහිතව හෝ රහිතව ඉඩ ලබාදිය යුතු ය.

බලපත්‍රයක් දරන්නකුගේ කාර්යය.

27. ප්‍රවාහනය ලබාදීම කෙරෙහි බලපාන්නා වූ හෝ ඒ කෙරෙහි අදාල වන්නා වූ අවස්ථානුගත කරුණු වෙනස්වීම සම්බන්ධයෙන් අධිකාරිය වෙත දැනුම් දීම බලපත්‍ර දරන්නාගේ කාර්යය විය යුතු ය.

20 වැනි වගන්තිය යටතේ වන බලපත්‍රවල ඇතුළත් විය යුතු කොන්දේසි.

28. 20 වැනි වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද සෑම බලපත්‍රයකම මහජනතාවගේ ආරක්ෂාව හා පහසුව තහවුරු කිරීම සඳහා අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් කොන්දේසි ඇතුළත් කළ යුතු ය. එම කොනදේසිවල වෙනත් කරුණු අතර පහත සඳහන් කොන්දේසි ඇතුළත් විය යුතු ය -

(අ) යම් බලපත්‍රයක අධිකාරිය යටතේ යොදාගනු ලබන බස්රථය බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලබන මාර්ගය හෝ මාර්ගවල පමණක් සහ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති කාලසටහනට අනුකූලව ධාවනය කරනු ලැබිය යුතු බවට ;

(ආ) බලපත්‍රයේ අධිකාරිය යටතේ යොදාගනු ලබන බස්රථයේ කාල සටහනේ හා ගාස්තු සටහනේ

පිටපත් ගෙන යා යුතු බවට හා එහි ප්‍රදර්ශනය කළ යුතු බවට ;

(ඇ) බලපත්‍රය අදාළ වන්නා වූ මාර්ගයේ බස්රථ ධාවනය කළ යුතු බවට ;

(ඈ) යම් බලපත්‍රයක අධිකාරිය යටතේ යොදගනු ලබන බස්රථ සියලු අවස්ථාවල දී යෝග්‍ය හා සේවා කළහැකි තත්වයෙන් පවත්වාගෙන යා යුතු බව ;

(ඉ) යම් බලපත්‍රයක අධිකාරිය යටතේ යොදගනු ලබන බස්රථයක රියදුරු හා කොන්දෙස්තරවරයා සම්බන්ධයෙන් ඔවුන් අඛණ්ඩව සේවය කළ යුතු කාලය හා ඔවුන් වැඩ කළ යුතු පැය ගණන හෝ විවේක කාලය සහ ඔවුන්ගේ වේතන සම්බන්ධයෙන් වන යම් ලිඛිත නීතියක නියමයන්වලට අනුකූල විය යුතු බවට ;

(ඊ) කොන්දෙස්තරවරයා විසින් මගියා වෙත ටිකට්පතක් නිකුත් කළ යුතු බවට ;

(උ) කොන්දෙස්තරවරයා විසින් එහි බලපත්‍රයේ නිශ්චිතව සඳහන් උපරිම මගීන් සංඛ්‍යාව ඉක්මවනු ලබන මගීන් සංඛ්‍යාවක් සඳහා ඉඩ ලබා නොදිය යුතු බවට ;

(ඌ) කොන්දෙස්තරවරයා විසින් ගාස්තු සටහනේ සඳහන් ගාස්තු ඉක්මවන ලබන යම් ගාස්තුවක් අය නොකළ යුතු බවට ;

(එ) යම් බසරථයක් අතරමග ඇණහිටි අවස්ථාවක් සම්බන්ධයෙන් කොන්දෙස්තරවරයා විසින් සමානුපාතිකව බස් ගාස්තුව ආපසු ගෙවිය යුතු බවට ;

(ඒ) යම් බලපත්‍රයක අධිකාරිය යටතේ යොදගනු ලබන බස්රථයක සේවයේ යෙදී සිටින රියදුරු සහ කොන්දෙස්තරවරයා සෑම අවස්ථාවක දී ම අවධානයෙන් සිටිය යුතු බවට සහ බස්රථයේ ගමන් කරන මගීන්ගේ යහපැවැත්ම හෝ පහසුව කෙරෙහි බලපෑමක් ඇති විය හැකි යම් අවස්ථානුගත කරුණු මඟහරවා ගැනීම හෝ වැළැක්වීම සඳහා සුදුසු පියවර ගත යුතු බවට ;

(ඔ) සහනදායී වාර ප්‍රවේශපත් පිළිබඳ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන යම් විධානයකට අනුකූලව ක්‍රියාකළ යුතු බවට ;

(ඕ) අවශ්‍ය අවස්ථාවන්හි දී, බලපත්‍ර දරන්නා විසින් සඳහන් කරනු ලැබ ඇති කොන්දේසිවලට අනුකූලව මගීන් සඳහා සෑහීමට පත්විය හැකි සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීම තහවුරු කිරීම සඳහා අධිකාරිය සමග යම් ගිවිසුමකට අත්සන් තබනු ලැබිය යුතු බවට ;

(ක) බලපත්‍රයේ අධිකාරිය යටතේ යොදගනු ලබන බස්රථයේ සේවයේ යෙදෙන රියදුරු සහ කොන්දෙස්තරවරයා සෑම අවස්ථාවක දී ම මගීන් වෙත කාරුණික සහ ආචාරශීලි සම්පන්න විය යුතු බවට ;

(ග) රියදුරු සහ කොන්දෙස්තරවරයා නිල ඇඳුමින් සැරසී සිටිය යුතු බවට.

29. අධිකාරිය විසින්, බලපත්‍රය මගින් බලය පවරන ලද බස්රථය සඳහා බලපත්‍රය ප්‍රදනය කරනු ලබන අවස්ථාවේදී එයට විශේෂිත වූ අංකය සහ අවශ්‍යයයි සලකනු ලබන වෙනත් යම් විස්තර එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය. බලය පවරන ලද බස්රථය පිළිබඳව බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කිරීම.

30. අධිකාරිය විසින් වලංගු මගී ප්‍රවාහන බලපත්‍රයක් දරනු ලබන යම් තැනැත්තකු වෙත විධාන නිකුත් කළ හැකි අතර එවැනි විධාන නිකුත් කරන ලද තැනැත්තා විසින් එහි නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත උතුරු පළාත් ඇතුළත එවැනි යම් විධානයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය. වෙනත් තැනැත්තන් වෙත විධාන නිකුත් කිරීමට අධිකාරියට ඇති බලය.

31. (1) උතුරු පළාත ඇතුළත මගී ප්‍රවාහන සේවාවක නියැලීමට අපේක්ෂා කරනු ලබන යම් තැනැත්තකු

බස් රථයක නව හිමිකරුවන් විසින් හිමිකාරත්වය පිළිබඳ වෙනස්වීමක් අධිකාරිය වෙත දැනුම් දිය යුතු බව.

විසින් යම් බලපත්‍රයක් දැනටමත් නිකුත් කරනු ලැබ ඇති බස්රථයක් මිළ දී ගනු ලබන විට එම බස්රථයේ හිමිකාරත්වය වෙනස්වීම පිළිබඳව අධිකාරිය වෙත වහාම දැනුම් දිය යුතු අතර එම බස්රථය සම්බන්ධයෙන් අධිකාරිය විසින් ලබාදෙන ලද යම් විධානයකින් බැඳී සිටිය යුතු ය.

(2) යම් බලපත්‍රයක් ලබාගෙන ඇති යම් ක්‍රියාකරුවකු විසින් ඔහු හිමිකාරත්වය දරන බස්රථය විකිණීම හෝ අන්සතු කරනු ලබන විට එම දිනයේ සිට දින හැටක් ඇතුළත අධිකාරිය මගින් එම බලපත්‍රය වෙනස් බස්රථයක් සඳහා සංශෝධනය කළ යුතු ය. එසේ සංශෝධනය නොකරන ලද විට එම බලපත්‍රය අවලංගු වී ඇති බවට සලකනු ලැබිය යුතු ය.

බලපත්‍රයක් දරන්නකු විසින් විස්තර පිළිබඳ යම් වෙනස් වීමක් අධිකාරිය වෙත දැනුම් දිය යුතු බව.

32. (1) බලපත්‍ර දරන්නකු විසින්, බලපත්‍රය ලබාගැනීම සඳහා වන තම ඉල්ලීමෙහි සඳහන් කරනු ලැබ ඇති යම් විස්තර පිළිබඳ යම් වෙනස්වීමක් එසේ වෙනස්වීම සිදු වූ දිනයේ සිට දින දහතරක් ඇතුළත ලිඛිතව අධිකාරිය වෙත දැනුම් දිය යුතු අතර ඒ පිළිබඳ එහි තීරණය ලිඛිතව ලබාගත යුතු ය.

(2) වලංගු බලපත්‍රයක් සතු යම් බස්රථයක් යම් ක්‍රියාකරුවකු විසින් මිළ දී ගනු ලබන හෝ ඔහු වෙත පවරාගනු ලබන විට සහ අළුත් මගී සේවා බලපත්‍රයක් ලබාගෙන ඇති විට එම බස්රථය සඳහා පෙර නිකුත් කරන ලද මගී සේවා බලපත්‍රයේ ලබා දී ඇති විශේෂයෙන් ම මාර්ගය හෝ කාලසටහන පිළිබඳ යම් අයිතියකට ක්‍රියාකරුවකු හිමිකම් නොලැබිය යුතු ය.

වාමුවාවෙහි බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු බව.

33. බලපත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් බස්රථයක් සම්බන්ධයෙන් ද එම බස්රථයේ වාමුවාවෙහි ප්‍රකටව පෙනෙන ලෙස එම බලපත්‍රය ප්‍රදර්ශනය කිරීම යම් බලපත්‍ර දරන්නකුගේ කාර්යය විය යුතු ය.

## *IV වන කොටස*

### *අධිකාරියේ කාර්ය මණ්ඩලය*

අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා.

34 (1) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ එකඟත්වය ඇතිව අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් යම් තැනැත්තකු පත්කළ යුතු අතර ඔහු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතු ය.

(2) මණ්ඩලයේ සියලු රැස්වීම් සඳහා පැමිණ සිටීමට හා එහි දී කථා කිරීමට සාමාන්‍යාධිකාරීවරයාට හිමිකම තිබිය යුතු නමුත් එවැනි රැස්වීම්වල දී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය.

(3) සාමාන්‍යාධිකාරීවරයා විසින්, මණ්ඩලයේ පොදු විධානයට හා පාලනයට යටත්ව අධිකාරියේ නිලධාරියන් හා සේවකයන්ගේ පරිපාලනමය පාලනය ඇතුළුව අධිකාරියේ සියලු කටයුතු පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු ය.

(4) අමාත්‍යවරයා විමසා මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් සාමාන්‍යාධිකාරවරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ එකගත්වය ඇතිව සහ ඒ සඳහා හේතු දක්වා (1) වැනි උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාන්‍යාධිකාරවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

සාමාන්‍යාධිකාරිවරයා විසින් ඔහුගේ කර්තව්‍ය අභිනියෝජනය කළ හැකි බව.

35. සාමාන්‍යාධිකාරවරයා විසින් මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ ඔහු විසින් අවශ්‍යයයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී මෙම ප්‍රඥප්තිය මගින් ඔහු වෙත පනවන ලද හෝ පවරා දෙන ලද යම් කර්තව්‍යයක් හෝ කාර්යයක් අධිකාරියේ යම් නිලධරයකු වෙත අභිනියෝජනය කළ හැකි අතර එම නිලධරයා විසින් සාමාන්‍යාධිකාරිවරයාගේ විධානයට හා පාලනයට යටත්ව එම කර්තව්‍යය හෝ කාර්යය ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

36. අසනීපවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා සාමාන්‍යාධිකාරවරයාට

ඔහුගේ කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ එකඟත්වය ඇතිව එම නොපැමිණ සිටින කාලය තුළ දී ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා අධිකාරියේ වෙනත් යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකු පත් කරනු ලැබිය හැකි ය.

සාමාන්‍යාධිකාරීවරයා තාවකාලිකව පැමිණ නොසිටීම.

අධිකාරියේ කාර්ය මණ්ඩලය පත් කිරීම, වැටුප් ගෙවීම හා විනය පාලනය.

37. (1) මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරීවරයාගේ හෝ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව මෙම ප්‍රඥප්තිය යටතේ වන එහි බලතල, කර්තව්‍ය හා කාර්ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන් සහ සේවකයන්ට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට හා අනුප්‍රමාණයකට අනුව යම් පරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු අතර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(3) (1) වැනි උපවගන්තිය යටතේ පත්කරන ලද කාර්ය මණ්ඩලයේ විනය පාලනය මණ්ඩලය විසින් ලබාදෙනු ලබන නියමයන්ට සහ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව සාමාන්‍යාධිකාරීවරයා හෝ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත්කිරීම.

38. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධාරියකු ඒ නිලධාරියාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය හෝ පළාත් රාජ්‍ය පරිපාලන භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ උතුරු පළාත් ආණ්ඩුකාරවරයාගේ කැමැත්ත ඇතිව අදාළ මණ්ඩලය විසින් තීරණය කළ හැකි කාලයකට ඒ අදාළ අධිකාරියේ කාර්යමණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ ඔවුන්ගේ කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කිරීම හෝ කළ හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අදාළ අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 (2) වැනි වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නිලධරයකු අදාළ අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 (3) වැනි වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) (1) වන, (2) වන හා (3) වැනි උපවගන්ති යටතේ අධිකාරිය වෙත යම් රජයේ නිලධරයකු පත් කරන ලද විට ආණ්ඩුවේ හා පළාත් සභාවේ සේවය සඳහා පත්කිරීම සම්බන්ධයෙන් අදාළවන විධිවිධාන සලකා බැලිය යුතු ය.

(5) යම් නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදයක් සේවය කිරීමට අවස්ථාවෝචිත පරිදි, ආණ්ඩුව සමග හෝ උතුරු පළාත් සභාව සමග ගිවිසුමකට එළඹී සිටින තැනැත්තකු මණ්ඩලය විසින් සේවයට බඳවා ගනු ලබන අවස්ථාවක දී, අදාළ මණ්ඩලයට සේවය කරන යම් කාලපරිච්ඡේදයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි, ආණ්ඩුවට හෝ උතුරු පළාත් සභාවට සේවය කිරීමක් ලෙස සැලකිය යුතු ය.

## *V* වන කොටස

### *අරමුදල*

39. (1) අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු ය.

අධිකාරියේ අරමුදල.

(2) අධිකාරියේ අරමුදලට -

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා උතුරු පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ආණ්ඩුව මගින් ප්‍රදානය කරනු ලබන සියලු මුදල් ;

(ඇ) මෙම ප්‍රඥප්තිය මගින් විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි අධිකාරිය මගින් ප්‍රදානය කරනු ලබන

යම් අනුමැතියක් හෝ නිකුත් කරන ලද යම් සහතිකයක් සඳහා අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් හෝ යම් බලය පවරන ලද නියෝජිතයකු විසින් ලබාදෙන ලද සේවා සඳහා ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් හෝ ආදයම් ;

(ඈ) මෙම ප්‍රඥප්තිය හෝ වෙන් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරියේ අරමුදලට අන්‍යාකාරයකින් බැර කරනු ලබන වෙනත් සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය

මුදල් වර්ෂය.

40. අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් සහ විගණනය.

41. (1) මණ්ඩලය විසින් අධිකාරියේ ආදයම හා වියදම සම්බන්ධයෙන් ද වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ද වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් ද නිසි ගිණුම් පොත් තබා ගැනිමට සැලැස්විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන සහ තත්කාලයේ බලපවත්නා වූ යම් මුදල් රීතී අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදළ වීම.

42. 1971 අංක 38 දරන මුදල් පනතේ II වැනි කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අධිකාරියේ මුදල් පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදළ විය යුතු ය.

## ***VI* වන කොටස**

*වැරදි සහ දණ්ඩනයන්*

වැරදි.

43. යම් තැනැත්තකු -

(අ) මණ්ඩලය විසින් එම තැනැත්තා වෙත නිකුත් කරන ලද යම් විධානයකට හෝ පනවන ලද යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින ලද විට ;

(ආ) මෙම ප්‍රඥප්තිය මගින් පවරන ලද යම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී අධිකාරිය විසින් ලිඛිතව බලය පවරන ලද යම් තැනැත්තකුට බාධා කිරීමක් හෝ ප්‍රතිරෝධය දැක්වීමක් සිදු කරනු ලබන විට ;

(ඇ) අධිකාරිය විසින් නියම කරන ලද විට යම් වාර්තා, තොරතුරු හෝ ලිඛිත පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීම නොකර හරිනු ලබන විට හෝ ප්‍රතික්ෂේප කරනු ලබන විට ;

(ඈ) ඔහුගේ දැනුම අනුව සාවද්‍ය හෝ වැරදි සහගත තොරතුරු ඇතුළත් යම් වාර්තාවක්, තොරතුරක් හෝ ලිඛිත පැහැදිලි කිරීමක් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන විට ;

(ඉ) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන උල්ලංඝණය වන අයුරින් ක්‍රියා කරනු ලබන විට,

මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබු විට රුපියල් දසදහසක් නොඉක්මවනු ලබන දඩ මුදලකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වන සිර දඬුවම් හෝ එම දඩය සහ සිර දඬුවම් යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

44. යම් තැනැත්තකු මගී ප්‍රවාහනය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මගී ප්‍රවාහනයේ නිරතවන විට වරදක් සිදු කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවනු ලබන දඩ මුදලකට හෝ මාස හයක් නොඉක්මවනු ලබන කාලසීමාවක් සඳහා වන සිර දඬුවම් හෝ එම දඩය හා සිර දඬුවම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර දෙවන වරට සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් දසදහසක් නොඉක්මවනු ලබන දඩ මුදලකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවනු ලබන කාලසීමාවක් සඳහා වන සිර දඬුවම් හෝ එම දඩය සහ සිර දඬුවම යන දඬුවම් දෙකටම හෝ ඉන්පසුව සිදුකරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පහලොස්දහසක් නොඉක්මවනු ලබන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවනු ලබන කාලසීමාවක් සඳහා වන සිර දඬුවම් හෝ එම දඩය සහ සිර දඬුවම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. වලංගු බලපත්‍රයක් නොමැතිව මගීන් ප්‍රවාහනය කිරීමේ නිරතවීම.

45. යම් බස්රථයක කොන්දෙස්තරවරයා යම් මගියකුගෙන් වැඩිපුර ගාස්තු අයකරගෙන ඇති විට ඔහු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවනු ලබන දඩ මුදලකට හෝ මාස තුනක් නොඉක්මවනු ලබන කාලසීමාවක් සඳහා වන සිර දඬුවම් හෝ එම දඩය හා සිර දඬුවම් යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර අධිකරණය විසින් දඬුවම් පැනවීමට අමතරව මගියාගෙන් එසේ වැඩිපුර අයකරන ලද ගාස්තුව ඔහු වෙත ආපසු ගෙවන ලෙස කොන්දෙස්තරවරයාට නියම කළ හැකි ය. වැඩිපුර අයකරන ලද ගාස්තුව ආපසු ගෙවිය යුතු බව.

46. යම් බස්රථයක කොන්දෙස්තරවරයා - කොන්දෙස්තරවරයා විසින් වරදක් සිදු කිරීම.

(අ) බස් නැවතුමක් නොවන වෙනත් යම් ස්ථානයකින් යම් මගියකුට බස්රථයකට ගොඩවීමට හෝ බස් රථයෙන් බැස යාමට අවසර ලබාදෙනු ලබන විට ;

(ආ) කරදරයක් ඇතිවිය හැකි ආකාරයෙන් කෑගැසීමට හා ශබ්ද නැගීමක් සිදු කරනු ලබන විට ; හෝ

(ඇ) ගාස්තු ලබා ගැනීමෙන් පසුව මගියකු වෙත ටිකට් පතක් නිකුත් කිරීම පැහැර හරිනු ලබන විට හෝ ප්‍රතික්ෂේප කරනු ලබන විට.

ඔහු විසින් වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් තුන්දහසක් නොඉක්මවනු ලබන දඩ මුදලකට හෝ මාස හයක් නොඉක්මවනු ලබන යම් කාලසීමාවක් සඳහා වන සිර දඬුවම් හෝ එම දඩය හා සිර දඬුවම් යන දඬුවම් දෙකටම හෝ යටත්විය යුතු ය.

47. (1) යම් මගියකු විසින් -

(අ) ඔහු වෙත නිකුත් කරන ලද ටිකට්පත ගමනාන්තය තෙක් තබා ගැනීම පැහැර හරිනු ලබන විට ; මගියකු විසින් වරදක් සිදුකිරීම.

(ආ) මණ්ඩලය විසින් බලය පවරන ලද යම් තැනැත්තකු එම ටිකට්පත ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට එසේ ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලබන විට ;

ඔහු රුපියල් පන්සියයක් දඩ මුදලකට යටත් විය යුතු අතර එයට අමතරව ඔහු විසින් ගමන් කරන ලද දුර සඳහා වන ටිකට්පතේ වටිනාකම මෙන් දෙගණයක මුදලක් මණ්ඩලය විසින් බලය පවරන ලද තැනැත්තකු වෙත ගෙවිය යුතු ය.

(2) යම් මගියකු (1) වැනි උපවගන්තියේ සඳහන් මුදල ගෙවීම පැහැර හරිනු ලබන විට වරදක් සිදු කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහස් පන්සීයයක් නොඉක්මවනු ලබන දඩ මුදලකට යටත්විය යුතු අතර එයට අමතරව ඔහු විසින් ගමන් කරන ලද ගමනාන්තය සඳහා වන ටිකට්පත සඳහා වූ දෙගුණයක මුදලක් ගෙවිය යුතු ය.

48. මෙම ප්‍රඥප්තිය යටතේ වන යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරන ලද විට - පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි.

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන විට එම වරද සිදුකරන ලද අවස්ථාවේ දී එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයා, සාමාන්‍යාධිකාරීවරයා, ලේකම්වරයා හෝ වෙනත් ඒ හා සමාන නිලධරයකු වශයෙන් සිටි සෑම තැනැත්තකුම ; හෝ

(ආ) එම පුද්ගල මණ්ඩලය සමාගමක් වන විට, එම වරද සිදු කරන ලද අවස්ථාවේ දී එම සමාගමේ හවුල්කරුවකු වශයෙන් සිටි සෑම තැනැත්තකුම,

එම වරද ඔහුගේ දැනුම් හෝ කැමැත්තෙන් තොරව සිදු කරන ලද බවට සහ ඔහුගේ කර්තව්‍යවල ස්වභාවය හා සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන ඔහු විසින් දැක්විය යුතු සියලු නිසි අවධානය එම වරද සිදු කිරීම වැලැක්වීම සඳහා දක්වන ලද බවට ඔප්පු කරනු ලැබුවහොත් මිස එම වරද සඳහා වරදකරු වන බවට සලකනු ලැබිය යුතු ය.

## *VII වන කොටස*

*පොදු විධි විධාන*

බලපත්‍රයක් දරන්නකු වෙත සිදු කරනු ලබන සීමාකිරීම්.

49. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ යම් මාර්ගයක ප්‍රවාහන සේවා ලබාදීම සඳහා යම් බස්රථයකට බලපත්‍රයක් නිකුත් කරනු ලබන විට එම බස් රථයේ බලපත්‍රය දරන්නා විසින් එම බස් රථය බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති යම් ප්‍රවාහන සේවාවක් සඳහා මිස වෙනත් යම් ප්‍රවාහන සේවාවක් සඳහා යොදා නොගත යුතු ය.

බස්රථයක් සඳහා එක් බලපත්‍රයක් නිකුත් කළ යුතු බව.

50. යම් මාර්ගයක ප්‍රවාහන සේවා ලබාදීම සඳහා දැනටමත් බලපත්‍රයක් නිකුත් කර ඇති බස්රථයක් සඳහා අධිකාරිය විසින් වෙනත් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

වාර්තා යනාදිය.

51. අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධිකාරියට වාර්තා යනාදිය අවශ්‍ය විය හැකි යම් වාර්තා, තොරතුරු හෝ පැහැදිලි කිරීම් දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලසීමාවක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස නියම කරමින් බලපත්‍ර දරන්නා වෙත ලිඛිත දැන්වීමක් ලබාදිය හැකි අතර එම දැන්වීමෙහි සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම එම බලපත්‍ර දරන්නාගේ කාර්යය විය යුතු ය.

අමාත්‍යවරයාගේ නිර්දේශ.

52. අමාත්‍යවරයා විසින්, මගී ප්‍රවාහන සේවාවල ප්‍රතිලාභය සඳහා බස්රථ මිල දී ගැනීම සහ බදු සහන ලබාදීම සම්බන්ධයෙන් වන රජයේ පොදු ප්‍රතිපත්තියට අනුව පහසුකම් ලබාදීම පිණිස උතුරු පළාත් සභාවේ අනුමැතිය සඳහා උචිත අවස්ථාවන්හි දී යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

යම් බස්රථයකට ඇතුළුවීමට ඇති බලය.

53. අධිකාරිය විසින් ඒ සඳහා ලිඛිතව බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ඕනෑම අවස්ථාවක දී -

(අ) බලපත්‍රයක් මගින් එම බස් රථය සඳහා බලය පවරා තිබේ ද හෝ එම බලපත්‍රයේ ඇතුළත් කොන්දේසි හෝ නිකුත් කරන ලද යම් විධානයන්ට අනුකූලව ක්‍රියා කරනු ලැබ තිබේ ද හෝ මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානයන්ට අනුකූලව ක්‍රියාකර තිබේ ද යන කාරණා පිළිබඳව නිශ්චිතව දැන ගැනීම සඳහා මගී ප්‍රවාහනය සඳහා යොදගනු ලබන බස්රථයකට ඇතුළු විය හැකි ය ;

(ආ) එම බස්රථය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබ ඇති බලපත්‍රය හෝ ලොග් සටහන හෝ එම බස්රථයට අදළ වන්නා වූ වෙනත් යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස එම බස්රථයේ රියදුරුට නියම කළ හැකි ය ;

(ඇ) එම ලොග් සටහන හෝ වෙනත් ලේඛනයක් භාරයට ගැනීම හෝ එහි පිටපතක් ලබාගැනීම සිදු කළ හැකි ය.

නිශ්චිත කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් විධාන නිකුත් කළ හැකි බව.

54. (1) මගීන්ගේ යහපත සඳහා උතුරු පළාත තුළ බස්රථ නැවතුම්පොළවල සහ බස්රථ නැවතුම් ස්ථානවල පිහිටීම් යම් ආකාරයකින් ඇති කිරීම, ඉවත් කිරීම, පවත්වාගෙන යාම, වැඩිදියුණු කිරීම හෝ වෙනස් කිරීම සඳහා විධාන නිකුත් කිරීමට හා අදළ පළාත් පාලන ආයතනය තුළින් හෝ සුදුසු යයි සලකනු ලබන වෙනත් යම් ආකාර තුළින් ඒ සඳහා වැඩපිළිවෙළවල් සකස් කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(2) බස්රථ නැවතුම්පොළවල හෝ බස්රථ නැවතුම් ස්ථානවල සිට බස්රථ ක්‍රියාත්මක කිරීම සඳහා කාලසටහන් බලාත්මක කිරීමට සහ ඒ පිළිබඳව අධීක්ෂණය කිරීම සහ කාලසටහන් කළමනාකරණය කිරීමේ නියැලී සිටින කාර්ය මණ්ඩලිය අධීක්ෂණය කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙළවල් සකස් කිරීම සහ එම කාර්යමණ්ඩලයට විධාන හා උපදෙස් නිකුත් කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(3) සාමාන්‍යාධිකාරිවරයා හෝ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මණ්ඩලයේ ඒකාග්‍රත්වය ඇති බස්රථ ක්‍රියාත්මක කිරීම සඳහා වන කාලසටහන් කළමනාකරණය කිරීමේ නියැලී සිටින කාර්ය මණ්ඩලය පත්කිරීම, ඔවුන් සේවයෙන් පහකිරීම ඇතුළුව ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සිදුකළ හැකි ය.

(4) ග්‍රාමීය ප්‍රදේශවල හා පාසැල් ළමුන් සඳහා වන ප්‍රවාහන සේවා සඳහා මණ්ඩලය විසින් විධාන නිකුත් කළ හැකි ය.

55. (1) මණ්ඩලය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ වන එහි යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය ලිඛිතව නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව මණ්ඩලයේ සභාපතිවරයා හෝ සාමාජිකයෙකු වෙත පවරනු ලැබිය හැකි අතර සභාපතිවරයා හෝ එම සාමාජිකයා මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන යම් විශේෂ හෝ පොදු විධානයන්ට යටත්ව එම බලතල, කර්තව්‍ය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කළ යුතු ය.

අධිකාරියේ බලතල, කර්තව්‍ය හා කාර්ය පැවරීම.

(2) (1) වැනි උපවගන්තිය යටතේ සඳහන් යම් බලය පවරාදීමක් නොතකා මණ්ඩලය විසින් එසේ බලය පවරන ලද යම් බලතල, කර්තව්‍ය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

56. අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ වන බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය වෙත යම් පොදු හෝ විශේෂ විධාන කලින් කළ නිකුත් කරනු ලැබිය හැකි අතර එවැනි විධානයන්ට අනුකූලව ක්‍රියා කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන.

57. (1) මණ්ඩලය විසින් පෙර වර්ෂය හා අදාළ කටයුතු පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් සෑම වර්ෂයකම අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

වාර්ෂික වාර්තාව.

(2) (1) වැනි උපවගන්තිය යටතේ වන වාර්තාව අමාත්‍යවරයා වෙත සෑම වර්ෂයකම ජුනි මස තිස්වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව උතුරු පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

58. මණ්ඩලයේ සියලු සාමාජිකයන් හා අධිකාරියේ නිලධරයන්, සේවකයන් හා නියෝජිතයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ හා අධිකාරියේ සියලු සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සැලකෙන බව.

59. (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව අදාළ අධිකාරිය උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලබන අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

60. (1) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියෙහි ගෙනෙනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද සියලු වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය වෙත ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද ගාස්තු කිසිවක්, අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු බව.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ මණ්ඩලයේ යම් සාමාජිකයකු, සාමාන්‍යාධිකාරිවරයා, යම් නිලධරයකු හෝ අධිකාරියේ වෙනත් යම් සේවකයකු විසින් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් හෝ ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම් ඒ වියදම, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කරනු ලැබී නම් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

61. (අ) පුද්ගලික බස්රථ හිමිකරුවන්ගේ, ත්‍රිරෝද රථ හිමිකරුවන්ගේ, සැහැල්ලු වාහන හිමිකරුවන්ගේ, බරවාහන හිමිකරුවන්ගේ හා භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන වාහන හිමිකරුවන්ගේ සංගම් ඇති කිරීම හා ලියාපදිංචි කිරීම ;

මාර්ගෝපදේශ

(ආ) වාහන හිමිකරුවන්ගේ සංගම් ඇති කිරීම හා අධීක්ෂණය කිරීම ;

(ඇ) මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව ඔවුන්ගේ ව්‍යවස්ථාව හා රීති සකස් කිරීම සඳහා සහාය ලබාදීම,

ඇතුළුව උතුරු පළාත තුළ පදිංචි තැනැත්තන් හා එම පළාතට පැමිණෙන තැනැත්තන් සඳහා සුරක්ෂිත, කාර්යක්ෂම හා ආරක්ෂාකාරී ප්‍රවාහන සේවාවක් ලබාදීම පිණිස මණ්ඩලය විසින් කලින් කළ මාර්ගෝපදේශ නිකුත් කළ හැකි ය.

නියෝග.

62. (1) අමාත්‍යවරයා විසින්, මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හා මූලධර්ම ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් සියලු කරුණු හෝ යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය -

(අ) බලපත්‍රයක් ලබාගැනීමේ දී, අළුත් කිරීමේ දී, පැවරීමේ දී හෝ සංශෝධනය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, යොදගත යුතු ආකෘතිපත්‍ර සහ ගෙවනු ලැබිය යුතු ගාස්තු ;

(ආ) බලපත්‍රයක අධිකාරිය යටතේ යොදගනු ලබන බස්රථයක තිබිය යුතු අංක තහඩු සහ සළකුණු ;

(ඇ) යම් බලපත්‍රයක අධිකාරිය යටතේ යොදගනු ලබන බස්රථයක රියදුරන් හා කොන්දෙස්තරවරුන් විසින් එහි ගෙනයා යුතු ලේඛන සහ ඒවායේ ඇතුළත් කරනු ලැබිය යුතු විස්තර ;

(ඈ) යම් බලපත්‍රයක අධිකාරිය යටතේ බස්රථයක් යොදවනු ලබන යම් තැනැත්තෙකු විසින් අනුගමනය කළ යුතු ප්‍රමිති සහ එම ප්‍රමිති උල්ලංඝණය කරමින් යම් ක්‍රියා හෝ නොකර හැරීම් සිදු කිරීම තහනම් කිරීම ;

(ඉ) යම් බලපත්‍රයක අධිකාරිය යටතේ යොදගනු ලබන බස්රථයක් විසින් සිදුකරනු ලබන ගමන් සම්බන්ධයෙන් තබාගත යුතු වාර්තා ;

(ඊ) යම් බලපත්‍රයක් දරන්නකු විසින් යම් බලපත්‍රයක අධිකාරිය යටතේ යොදවනු ලබන බස්රථවල රියදුරන් හෝ කොන්දෙස්තරවරුන් වශයෙන් සේවයේ යොදවනු ලබන තැනැත්තන් සම්බන්ධයෙන් තබාගත යුතු වාර්තා සහ එම තැනැත්තන් විසින් වැඩ ආරම්භ කළ යුතු හා අවසන් කළ යුතු වේලාවන් සහ ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් ;

(උ) මෙම ප්‍රඥප්තිය යටතේ තබාගත යුතු වාර්තා සංරක්ෂණය කිරීම, අධිකාරිය විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් එම වාර්තා පරීක්ෂා කිරීම සහ අධිකාරිය විසින් ඉල්ලනු ලැබූ විට එම වාර්තා එසේ පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා ඉදිරිපත් කිරීම ;

(ඌ) මගී ප්‍රවාහන සේවය සම්බන්ධයෙන් බලපත්‍ර දරනු ලබන තැනැත්තන් විසින් කටයුතු කළ යුතු සහ කර්තව්‍ය ඉටුකළ යුතු කාර්ය පටිපාටිය ;

(එ) බලපත්‍ර දරන්නන් විමසා සකස් කරනු ලබන සහනදයී ටිකට්පත් හෝ වාර ප්‍රවේශපත් පිළිබඳ යම් යෝජනා ක්‍රමයක් ;

(ඒ) විශේෂයෙන්ම බස්රථ මෙහෙයුම්, වේලා සටහන් කිරීම හා පහසුකම් නිසි ලෙස හා සාධාරණ ලෙස යොද ගැනීම සම්බන්ධීකරණය කිරීම සහ ඒ සම්බන්ධයෙන් කාර්ය සටහන් සකස් කිරීම සඳහා බස්රථ නැවතුම්පොළවල් සහ බස්රථ නැවතුම් ස්ථාන සංවිධානය කිරීම හා කළමනාකරණය කිරීම ;

(ඔ) යම් බලපත්‍රයක අධිකාරිය යටතේ යොදවනු ලබන බස්රථවල සේවයේ යෙදී සිටින රියදුරන් සහ කොන්දෙස්තරවරුන්ගේ ශාරීරික යෝග්‍යතාව පිළිබඳව කලින් කළ පරීක්ෂා කිරීම් සිදු කිරීම සහ ඔවුන්ගේ සුදුසුකම් නිශ්චය කිරීම ;

(ඕ) උතුරු පළාත තුළ යම් ප්‍රදේශයක හෝ යම් මාර්ගයක මගී ප්‍රවාහන සේවා පිළිබඳ යම් බරපතල බිඳවැටීමක් සිදුවීමට ආසන්න බවට සලකනු ලබන විට හෝ හදිසි අවස්ථාවක දී හෝ බරපතල තත්ත්වයන් වල දී ගත යුතු ක්‍රියාමාර්ග ;

(ක) උතුරු පළාත තුළ මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීම හා කාර්යක්ෂමභාවය ඉහළ නැංවීම සඳහා අධිකාරිය වෙත උපදෙස් ලබාදීමේ කාර්යය සඳහා උපදේශන මණ්ඩල හෝ කමිටු ඇති කිරීම, ඒවාට සාමාජිකයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල හා කර්තව්‍ය, නව සේවා ආරම්භ කිරීම, මගීන්ගෙන් සහ බලපත්‍ර දරන්නන්ගෙන් අයකරනු ලැබිය යුතු ගාස්තු හා අයකිරීම්, විවිධ මාර්ගවල තිබෙන බස්රථ සංඛ්‍යාව විධිමත් කිරීම, බලපත්‍ර දරන්නන් විසින් සේවා පවත්වාගෙන යාමේ ආර්ථික ශක්‍යතාව පිළිබඳ සාධාරණත්වය තහවුරු කිරීම සහ වෙනත් යම් අදාළ කාරණාවන් ;

(ග) ශිෂ්‍යයන්, කාන්තාවන්, ළදරුවන්, ආබාධිත සහ වැඩිහිටි පුද්ගලයන් ඇතුළුව මගින් ගේ සුරක්ෂිතතාව, පහසුව සහ සුවපහසුව සඳහා නියෝග සකස් කිරීම හා බලාත්මක කිරීම.

(2) (1) වැනි උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට එය බලාත්මක විය යුතු ය.

(3) (1) වැනි උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා උතුරු පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට ඒ යටතේ ඊට පෙර සිදු කරන ලද යම් කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) එසේ යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

63. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී උතුරු පළාත ඇතුළත 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මෙම ප්‍රඥප්තියේ 20 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය. ඉතිරිකිරීම.

64. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන නොතකා, 3 වන වගන්තිය යටතේ අධිකාරිය පිහිටුවනු ලබනතෙක් අමාත්‍යවරයා විසින් අධිකාරියේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම කළ යුතු ය. අන්තර්කාලීන විධිවිධාන.

65. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම ප්‍රඥප්තියේ - අර්ථ නිරූපණය.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහනගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් උතුරු පළාත් ප්‍රවාහන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ.

"බස් රථය" යන්නෙන් මෝටර් වාහන පනත යටතේ බස් රථයක් වශයෙන් ලියාපදිංචි වී ඇති මෝටර් කෝච් රථයක් අදහස් වන අතර, එයට ද්විත්ව කාර්යය වාහනයක් ද ඇතුළත් වන බවට සලකනු ලැබිය යුතු ය.

"මගියා" යන්නෙන් යම් කුලී මෝටර් රථයක හෝ බස් රථයක ගෙන යනු ලබන තැනැත්තකු අදහස් වන නමුත් රියදුරු හෝ බස්රථයක් සම්බන්ධයෙන් වන විට කොන්දොස්තරවරයා ඊට ඇතුළත් නොවේ.

"නියමිත" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබූ යන්න අදහස් වේ.

66. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වූ විට, එවිට දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

10 - 435/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.